සබරගමුව පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-සති පාසල

විෂය - මව්බස

2021 ජුනි 14 සිට ජුනි 20 දක්වා සතිය

සතිය - 07

ශ්‍රේණිය :- 4

සැකසුම :- ඩබ්.කේ.ටී.මධුෂා මිය /ර/ඇඹි /තුංකම ම.වි. 4 ශ්‍රේණිය බාර

- පහත දැක්වෙන කතාව ශබ්ද නගා කියවන්න

## පුංචි තිසර

එදා සෙනසුරාදා දිනයකි. තිසර උදෑසන ම නැඟිට කාමරයේ ජනේලය අසලට ගියේ ය. හිමිදිරිය මොන තරම් ලස්සන ද? ජනෙල් පියන් පත් විවර කරද් දී අවට පරිසරය දුටු තිසරට සිතුණි. නිවස අසළ අඹ ගසේ සිටි කුරුල්ලා පියඹා ගියේ ජනෙල් පියනක් බිත්තියේ වැදුණු හඬිනි. නිදහසේ ඈතට පියඹා යන පක්ෂියා නොපෙනී යන තෙක් ම තිසර එදෙස බලා සිටියේ ය.පාසල් නිවාඩු දිනවල උදෙන් ම නැඟිට පාඩම් කිරීම තිසරගේ පුරුද්දකි. ඔහු පොත් මේසය අසලට යන විට වම් පාදය මේසයේ වැදිණ. ඌයි මගේ කකුල තිසරට ඉබේට ම කියවිණ. ඒ පිළිබඳ ව නොසිතූ තිසර කෑම කාමරයට ගියේ සුපුරුදු පරිදි වතුර වීදුරුවක් බීමට ය. ජල කරාමය අසල බිත්තියෙහි උණු කර නිවාගත් ජලය පානය කරන්න යයි තිසර වෙනුවෙන් ම අක්කා විසින් ලියන ලද දැන්වීම දුටුවේ ය. එය දුටු ඔහු මේසය මත තිබූ ගුරුලේත්තුවෙන් ගෙන වතුර වීදුරුවක් බිව්වේ ය.සිංහල පොත අතට ගත් තිසරට ඊයේ පාසලේ දී ගුරුතුමා කියූ පොතට කියන වෙනත් නමක් වූ ග්‍රන්ථය නම් වචනය සිහිපත් විය. අනතුරු ව ඔහු පොත රැගෙන පාඩම් කිරීමට පටන් ගත්තේ ඉමහත් ප්‍රබෝධයකිනි.

1)දෙමාපියන් ඡේදය කියවන විට දරුවන් ට සවන් දීමට යොමු කරන්න.

2)දරුවන්ට ද ඡේදය කියවීමට අවස්ථාව ලබා දෙන්න.

3)සමාන පද හැකි තරම් ලියන්න

| | |
|---|---|
| 1.කුරුල්ලා = පක්ෂියා, | 2.පාදය = කකුල, |
| 3.වතුර = ජලය, | 4.පොත = ග්‍රන්ථය |

4)පළමු වන, දෙවන හා තුන් වන ශ්‍රේණිවල දී ඉගෙන ගත් සමානාර්ථ පද වලට හැකිතරම් සමාන පද ලියන්න.

| | |
|---|---|
| 1.ගස = රුක | 2.අහස = ගුවන |
| 3.අම්මා = මව | 4.තාත්තා = පියා |
| 5.ඉර = හිරු | 6.ගෙදර = නිවස |
| 7.පාසල = විදුහල | 8.ඔළුව = හිස |
| 9.පාර = මාර්ගය | 10.තරු = තාරකා |
| 11.ප්‍රවෘත්තිය = පුවත | 12.කැලෑව = වනය |
| 13.දූපත = දිවයින | 14.රාත්‍රිය = රැය |
| 15.ඇස් = නෙත් | |

5)සමානාර්ථ පද යොදා වාක්‍ය සාදා ලියන්න.

උදෑසන ම අපේ ඇඟට සිසිලසක් දැනෙයි.

. . . . . . . අපේ ඇඟට සිසිලසක් දැනෙයි.

අඹ අත්තේ සිටින කුරුල්ලා හරි ම ලස්සන යි.

අඹ අත්තේ සිටින . . . . . . හරි ම ලස්සන යි.